මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

மஹபொல உயர்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்

Mahapola Higher Education Scholarship Trust Fund

2012

වාර්ෂික වාර්තාව හා ගිණුම්

வருடாந்த அறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS



2012

වාර්ෂික වාර්තාව හා ගිණුම්

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව

භාර අරමුදල

පටුන

අරමුදෙල් අරමුණු හා පරමාර්ථ	1
අරමුදලේ සංස්ථාපනය හා කළමණාකරණය – භාරකාර මණ්ඩලය	2
ආදායම් හා වියදම් විශ්ලේෂණය	4
මූලික අරමුදලේ තත්වය - ආයෝජන හා ආදායම	4
ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම	5
පාසල් සංවර්ධන අරමුදල	8
උපසමාගම් /ආශ්‍රිත සමාගම්	
ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය	9
නැෂනල් වෙල්ත් කෝපරේෂන් ආයතනය /නැට්වෙල්ත් සෙකුයුරිටීස් ආයතනය	13
මූල්‍ය ප්‍රකාශන	
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන	17
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහඳහා විගණකාධිපති වාර්තාව	50

දර්ශනය

" දිළිඳුකම තුරන් කිරීම ඉලක්ක කරගත් වියත් සමාජයක් බිහිකිරීම"

මෙහෙවර

" වරප්‍රසාද නොලත් යෞවනයනට උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් පහසුකම් නංවාලීම මඟින් සම අවස්ථා ඇති කිරීම. "

අරමුණු සහ අභිප්‍රායයන්

මෙම අරමුදලෙහි අරමුණු සහ අභිප්‍රායයන් පහත දැක්වේ.

- යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම.
- ද්විතියන අධ්‍යාපනය සතුටුදායක ලෙස සම්පූර්ණ කර සිටින ආධාර ලැබීමට සුදුසු යෞවනයින්ට උසස් අධ්‍යාපන ආයතනයකදී සිය අධ්‍යාපනික, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා උපකාර වන ආධාර සැපයීම.
- තරුණයින්ගේ හැකියා දියුණු කිරීම සඳහා වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම හා ඒවායෙහි කළමනාකරණයට සහායවීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පාසල් සහ ආයතන ආදිය පිහිටුවීම හා ඒවාට ආධාර සැලසීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පුද්ගලයින්ගේ නිපුණතා නංවාලීම සහ වර්ධනය කිරීම සඳහා ආධාර සැපයීම. (දැනට ප්‍රධාන වශයෙන් උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබාදීම මූලික හා ප්‍රමුඛ කාර්යය ලෙස සලකා ක්‍රියාකර ඇත.)

අරමුදලේ ආරම්භය

දිවංගත ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා විසින් 1980 වර්ෂයේදී ගරු වෙළඳ හා නාවික ඇමතිවරයා ලෙස හඳුන්වා දුන් "මහපොළ" සංකල්පය පළමුවෙන්ම වෙළඳ සල්පිලක් මඟින් ග්‍රාමීය ප්‍රජාව වෙත විවෘත ආර්ථිකයෙහි ප්‍රතිලාභ හා දැනුම අත්පත්කරදීම මූලික අභිප්‍රාය ඇතිව ආරම්භ කරන ලදී.

එහි ප්‍රතිඵල ලෙස ශිෂ්‍යත්ව 422 ක් ප්‍රදානය කර ආරම්භ කරමින් වර්ෂ 1981 දී ක්‍රියාත්මක කරන ලද මහපොළ ශිෂ්‍යත්ව වැඩපිළිවෙල මඟින් පසුගිය තිස් වසර තුල ශිෂ්‍යත්ව 200,000 කට වැඩි ප්‍රමාණයක් උසස් අධ්‍යාපනය සඳහා සිසුන්ට ලබාදී ඇති අතර 2012 සඳහා වර්ෂයකට රුපියල් මිලියන 900 ක් ශිෂ්‍යත්ව සඳහා වෙන් කිරීමට අරමුදල මඟින් ක්‍රියාකර ඇත. 2012 වර්ෂය අවසන් වන විට ශිෂ්‍යත්ව සඳහා රු. 680,573,470.00 ක් වැය කර ඇත.

ඒකාබද්ධ අරමුදලට අයත් නැති උසස් අධ්‍යාපනය සඳහා ආයතනික හා මූල්‍යමය ආධාර මෙන්ම, යෞවනයනට ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරෙන මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු ගරු අග්‍රාවිනිශ්වයකාරතුමා සභාපතීත්වය දරණ ස්වාධීන භාරකාර මණ්ඩලය මඟින් ස්වාධීනව ක්‍රියාත්මක වෙමින් පවතී.

භාරකාර මණ්ඩලය

නිල බලයෙන් :

1. අග්‍රවිනිශ්චයකාරතුමිය (ගරු සභාපතිතුමිය)
   ගරු ආචාර්ය. ශිරාණි බණ්ඩාරනායක මැතිණිය
2. සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍ය (ගරු ප්‍රාරම්භක භාරකරු)
   ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා
3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (ගරු භාරකරු)
   ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා
4. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (ගරු භාරකරු)
   ගෝඨාබය ජයරත්න මහතා
5. සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් (ගරු භාරකරු)
   සුනිල් එස්. සිරිසේන මහතා

නම් කල :

6. එස්. වී. ඩී. කේසරලාල් ගුණසේකර මහතා (ගරු භාරකරු)
7. මහාචාර්ය මලික් රණසිංහ මහතා (ගරු භාරකරු)
   උපකුලපති, මොරටුව විශ්ව විද්‍යාලය

(මෙම භාරකරුවන් විසින් භාරකාර මණ්ඩල රැස්වීම සඳහා කිසිම දීමනාවක් ලබා නොගනී.)

ආදායම හා වියදම

අරමුදලේ මූල්‍ය වත්කම් ආයෝජනය කිරීමෙන් ලැබෙන වාර්ෂික පොළී ආදායම ප්‍රධාන ආදායම් ප්‍රභවයවේ. පොළී ආදායම් වශයෙන් වර්ෂය තුළ රුපියල් 700,597,706/- ක් ලැබේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ප්‍රාග්ධනයට සම දායකත්වය සඳහා හිමි **50%** ක ලාභාංශ ලෙස රුපියල් 734,128,031/-ක මුදලක් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත ජනාධිපති අරමුදල මගින්ද මෙම වර්ෂය සඳහා ලබා දී ඇත. වෙළඳපොල පොලී අනුපාතය පහළ බැසීම නිසා වාර්ෂික පොලී ආදායම අඩුවීමේ ප්‍රවනතාවක් ඇතිවී තිබේ.

වසරේ මුළු වියදම වන රු.830,599,515/- ට සාපේක්ෂව අරමුදලේ මුළු ආදායම රු.1,434,725,736/- ක් විය. මහපොළ ශිෂ්‍යත්ව සඳහා මුදල් ගෙවීම ප්‍රධාන කාර්‍යය වූ අතර එම වියදමෙන් පසුව සංවර්ධන ලොතරැයියෙහි ඉහත සඳහන් ආදායමද ඇතුළු වර්ෂයෙහි රු. 718,920,138/- ක් වූ අතිරික්ත ආදායම, සමුච්චිත අරමුදලට එකතු කරන ලදි. මෙම අරමුදල, ආදායම් බදු වලින් නිදහස් බැවින් බදු පසු ආදායමෙහි වෙනසක් නොවේ.

මූලික අරමුදලේ තත්වය – ආයෝජන හා ආදායම

ආයෝජන



ආදායම



ශිෂ්‍යත්ව ප්‍රදානය

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරන පිරිස් අතර වාර්ෂිකව ප්‍රදානය කරන සීමිත මහපොළ ශිෂ්‍යත්ව කුසලතා ප්‍රමාණය අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව ප්‍රදානය කෙරේ. එහිදී ඉහළ ලකුණු ලබාගත් සිසුනට කුසලතාව පදනම් කර ගෙන මහපොළ කුසලතා ශිෂ්‍යත්වද එතැන් සිට කුසලතාවයට ප්‍රමුඛත්වය දෙමින් පවුලේ ආදායම සැලකිල්ලට ගෙන මහපොළ සාමාන්‍ය ශිෂ්‍යත්වද පිරිනමනු ලැබේ. වාර්ෂිකව වෙන් කරන මුළු මහපොළ ශිෂ්‍යත්ව සංඛ්‍යාවෙන් 10% කුසලතා ශිෂ්‍යත්ව වන අතර ඉතිරි 90% සාමාන්‍ය ශිෂ්‍යත්ව වෙන් කර ඇත. සාමාන්‍ය ශිෂ්‍යත්වයකට වඩා රු. 50/- ක් කුසලතා ශිෂ්‍යත්වයක් සඳහා ගෙවනු ලැබේ.

මෙම වර්ෂයේදී 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා 2011 අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් විශ්ව විද්‍යාල අධ්‍යාපනය පිණිස වර්ෂය තුල ඇතුලත් කල සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව 13,500 ක් ප්‍රදානය කිරීමට මහපොළ ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලය මගින් අනුමැතිය ලබා දෙන ලදි. මෙකී සංඛ්‍යාවෙන් 1350 ක් පමණ දෙනෙකු කුසලතා පදනම මත කුසලතා ශිෂ්‍යත්ව ලැබූ අතර ඉතිරි ශිෂ්‍යත්ව 12150 කුසලතා පදනම මත අඩු ආදායම් ලබන පවුල්වල සිසුන් වෙත පිරිනමනු ලැබේ. විශ්ව විද්‍යාලවලට ප්‍රවේශිත මුළු සිසුන් සංඛ්‍යාව වන 22,943 සමඟ සංසන්දනය කිරීමේදී සිසුන්ගෙන් 58.84% ක් මෙම මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය යටතේ ආවරණය විය. මේ අනුව 2012 වර්ෂයේදී

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් නිර්දේශිත පාඨමාලා සඳහා ඇතුලත් කල ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දෙන ලදි.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් නිර්දේශ කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණයට අමතර වශයෙන් පහත සඳහන් අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි හා වෘත්තිය ඩිප්ලෝමා පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව 1556 ක් පිරිනැමීමට ක්‍රියාකර ඇත.

මෙම වර්ෂයේදී පහත සඳහන් පරිදි එම ආයතනවල සිසුනට ශිෂ්‍යත්ව වෙන් කර ප්‍රදානය කරන ලදි.

	ආයතනය	සිසුන් සංඛ්‍යාව
1.	ශ්‍රී ලංකා නීති විද්‍යාලය	37
2.	ජාතික තාක්ෂණ ආයතනය, මොරටුව	70
3.	බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය	19
4.	බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලය	20
5.	ජාතික සමාජ සංවර්ධන ආයතනය (උපාධි 10 ඩිප්ලෝමා 14)	10
6.	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (ප්‍රාදේශිය ආයතන 15 කි)	1500
7.	ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය සඳහා ශිෂ්‍යත්ව 400 ක් වෙන් කරන ලදි.	400
		1556

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය 1981 - 2012



ශිෂ්‍යත්ව ගෙවීම

මහපොළ ශිෂ්‍යත්වලාභියෙකුට එක් අධ්‍යයන වර්ෂයකදී මසකට වාරිකය බැගින් ශිෂ්‍යත්ව වාරික 10 ක් ගෙවනු ලැබේ. ඒ අනුව ශිෂ්‍යත්වය වෙනුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා මහා භාණ්ඩාගාරයෙන් මාසිකව සපයන රු.350/- ක් ද ඇතුළුව සෑම මහපොළ ශිෂ්‍යත්වලාභියෙකුට පිළිවෙලින් කුසලතා ශිෂ්‍යත්ව සඳහා රු.2,550/- ක් ද සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා රු.2,500/- ක් ද විශ්ව විද්‍යාල මගින් ලබාදෙනු ලැබේ.





මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානයන් - 1981 වර්ෂයේ සිට

පාසල් සංවර්ධන අරමුදල

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ පිහිටුවා ඇති පාසල් සංවර්ධන අරමුදලෙහි පොලී ආදායමෙහි මුදලෙන් පාසල් **03** ක සංවර්ධන කටයුතු සඳහා ආධාර කිරිමට හැකි විය.

පාසලේ නම	ආධාර කළ මුදල (රු.)
1. ශාන්ත අන්තෝනි විද්‍යාලය - නුවර	5,775,930.40
2. ශාන්ත ආනා විද්‍යාලය - කුරුණෑගල රඟහල සහිත රැස්වීම් ශාලාව ඉදි කිරීම	23,601,722.33
3. රාහුල විද්‍යාලය - මාතර	20,000,000.00
එකතුව	**49,377,652.73**

තොරතුරු තාක්ෂණික අධ්‍යාපනය

විශ්ව විද්‍යාලවලට ඇතුලත්වීමට නොහැකි වූ සිසුන් ට උසස් අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වන පරිදි, තොරතුරු තාක්ෂණ අධ්‍යයන කටයුතු සඳහා 1999 වර්ෂයේදී මහපොළ භාරකාර මණ්ඩලය මගින් මාලඹේ පිහිටි මහපොළ ශිෂ්‍යත්ව අරමුදල සතු රනිස්තාන්වත්ත නැමති අක්කර 25 ක ඉඩමෙහි එම ආයතනය පිහිටුවන ලදි. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය අරමුදල මගින් ශිෂ්‍යත්ව ලබාදීමට අනුගාමිකව ඉටුකරන ලද තවත් මෙහෙවරකි.

මෙම අරමුදල යටතේ එම ආයතනය ස්ථාපිත කිරීමේ කටයුතු සඳහා කළමණාකරණ මණ්ඩලයක් ලෙස සීමිත ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ගැරන්ටි) සමාගම පිහිටුවිය. 1999 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය සඳහා මහපොළ ශිෂ්‍යත්ව අරමුදල මගින් රු.මිලියන 472 ක් වැය කරන ලදි.

එම ආයතනය මගින් තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා සහ තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලා සඳහා පහත සඳහන් පරිදි සිසුන් ඇතුලත් කර ඇත.

වර්ෂය	ඇතුලත් කළ සිසුන් සංඛ්‍යාව
2000 සිට 2011 දක්වා ඩිප්ලෝමා සඳහා	13,192
2012 උපාධි පාඨමාලා සඳහා	1,146
2012 ඩිප්ලෝමා පාඨමාලා සඳහා	1,076
එකතුව	21,485

මේ වන විට ඩිප්ලෝමා සහතික උපාධි පාඨමාලා මෙන්ම තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි දක්වාද පාඨමාලා එම ආයතනය මගින් පවත්වනු ලැබේ. එම පාඨමාලා හදාරන සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ ක්ෂෙත්‍රය තුල රැකියා අවස්ථා බහුලව පවතී.

නව ඉංජිනේරු හා කළමණාකරණ පාඨමාලාවන්ද හඳුන්වා දීමට ක්‍රියාකර ඇත.

2012.12.31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය

ගිණුම්කරණ කාලය අවසානයේ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි සමන්විත විය.

නම	තනතුර	නිල තනතුර
මහාචාර්ය සමරජීව කරුණාරත්න	**සභාපති**	
මහාචාර්ය බමුණුවිට ගමගේ ලලිත් දීප්ති කුමාර	**කළමණාකාර අධ්‍යක්ෂ**	
සෙනරත් විදානලාගේ දොන් කේසරලාල් ගුණසේකර මයා	**අධ්‍යක්ෂ**	**භාරකරු - ම.හා.අ.**
තේනුවර හේනැන්දිගේ රන්ජිත් තේනුවර ද සිල්වා මයා	**අධ්‍යක්ෂ**	**අධ්‍යක්ෂ - ම.හා.අ.**
ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න	**අධ්‍යක්ෂ**	**ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**
තිස්ස නන්දසේන මයා	**අධ්‍යක්ෂ**	**ලේකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**
තෙලිකඩ පල්ලියගුරුගේ නන්දසිරි ලීලාරත්න මයා	**අධ්‍යක්ෂ**	
තිලාන් මන්ජිත් විජේසිංහ මයා	**අධ්‍යක්ෂ**	
මහාචාර්ය ලක්ෂ්මන් ලොයිඩ් රත්නායක	**අධ්‍යක්ෂ**	
ආචාර්ය කෝලිය නයන්ත පුලසිංහ	**අධ්‍යක්ෂ**	
ආචාර්ය ගන්කන්දගේ මහේෂා ස්වර්ණමාලා කපුරුබණ්ඩාර	**අධ්‍යක්ෂ**	
ආචාර්ය විජේසුන්දර මුදියන්සේලාගේ මලිත නයනජිත් විජේසුන්දර	**අධ්‍යක්ෂ**	
දිනේෂ් බෝධිත සපරමාදු මයා	**අධ්‍යක්ෂ**	
දිලන්ත විතානගේ මයා	**අධ්‍යක්ෂ**	
ජනක ප්‍රසාද් මන්නාරම් ගමගේ	**අධ්‍යක්ෂ**	

2013.03.31 දිනට ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ගැරන්ටි) සමාගමේ මූල්‍ය තත්වය පහත දැක්වේ

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (ඇපයෙන් සීමිත) සමාගම
සමස්ථ ආදායම් විස්තරය
2013 මාර්තු 31 දිනට

	සටහන	කාණ්ඩය
		2012/2013
		Rs. Cts.
ආදායම	**4**	778,312,339.92
සෘජු වියදම්	**5**	226,403,843.63
දළ ලාභය		551,908,496.29
අනෙකුත් ආදායම්	**6**	12,175,953.17
		564,084,449.46
පරිපාලන වියදම්	**7**	414,534,315.33
අනෙකුත් ක්‍රියාකාරකම් වියදම්	**8**	17,587,653.80
		432,121,969.13
මෙහෙයුම් ලාභය		131,962,480.33
මූල්‍ය ආදායම්	**9**	91,442,312.25
බදුපෙර ලාභය		223,404,792.58
බදු		(24,484,071.00)
බදු පසු ලාභය		198,920,721.58
අනෙකුත් මෙහෙයුම් ලාභ		
ආගනනය කරන ලද ලාභය		2,038,598.96
මුළු ශුද්ධ ආදායම		2,038,598.96
මුළු ශුද්ධ ආදායම		200,959,320.54
ශුද්ධ ලාභය - කොටස්		
අයිතිකරුවන්ගේ ලාභ කොටස		195,572,537.68
සුළු කොටස් හිමියන්ගේ ලාභය		5,386,782.87
මුළු ශුද්ධ ලාභය		200,959,320.54

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ ගිණුම් කාලය 2012.04.01 සිට 2013.03.31 දක්වා වේ.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (ඇපයෙන් සීමිත) සමාගම
මූල්‍ය ප්‍රකාශය
2013 මාර්තු 31 දිනට

	සටහන	**31.03.2013**
		රු.
වත්කම්		
ජංගම නොවන වත්කම්		
දේපල උපකරණ හා වෙනත්	10	635,059,048.82
ආයෝජන	12	726,686,334.15
අනෙකුත් මූල්‍ය වත්කම්	13A	4,438,195.60
පවරා ගැනීම්-කීර්තිනාමය		1,575,646.16
		1,367,759,224.73
ජංගම වත්කම්		
අනෙකුත් මූල්‍ය වත්කම්	13B	2,728,885.24
ලැබිය යුතු වියදම්	14	
තැන්පතු	15	521,600.00
ණය ගැතියෝ හා ලැබියු යුතු ගෙවීම්	16	39,533,711.63
අත්තිකාරම් ගිණුම	17	42,384,078.42
මුදල් හා බැංක ශේෂ	18	95,364,083.44
		180,532,358.73
මුළු වත්කම්		**1,548,291,583.46**
අරමුදල හා වගකීම		
අරමුදල හා සංචිත		
මහපොළ අරමුදල් දායකත්වයි	19	373,400,000.00
අනෙකුත් අරමුදල්		1,556,362.25
අසම්භව්‍ය සංචිත		14,718,662.66
ඉ/ගෙන ආ ලාභ		898,797,627.19
		1,288,472,652.10
සුළු කොටස් හිමියන්ගේ අරමුදල		13,853,132.48
ජංගම නොවන වත්කම්		
පසු ගැලපුම් අධිභාර		1,118,655.08
සේවක ප්‍රතිලාභ	20	27,451,640.61
		28,570,295.69
ජංගම වගකීම්		
පසු ගැලපීම් ලාභ		2,871,196.64
සම්බන්ධ පාර්ශ්ව සඳහා ගෙවීම්	21	
ණය හිමියන් හා ගෙවිය යුතු ගෙවීම්	22	159,845,072.94
උපචිත වියදම්		54,679,233.62
	23	217,395,503.20
අරමුදල් සහ වගකීම්		**1,548,291,583.46**

නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ්

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සමාගමෙහි මුළු ප්‍රාග්ධනයට දායක වෙමින් රු.මිලියන 300 ක් ආයෝජනය කර සීමා සහිත "නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ්" නමින් සීමිත සමාගමක් මූල්‍ය කටයුතු සඳහා පිහිටුවා ඇති අතර, එමඟින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි මුදල් ද භාණ්ඩාගාර බිල් පත්‍ර, භාණ්ඩාගාර බැඳුම්කර සහ වෙනත් ආරක්ෂිත මූල්‍යමය මෙවලම් වල ආයෝජනය කරයි. එයට අනුබද්ධිතව පිහිටුවා ඇති සීමා සහිත "නැට්වෙල්ත් සෙක්‍යුරිටීස්" ආයතනය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල් පත්‍ර සහ බැඳුම්කර සඳහා ප්‍රාථමික නියෝජිත ආයතනයක් ලෙස ක්‍රියාකරනු ලැබේ.

2012.12.31 දිනට නැෂනත් වෙල්ත් කෝපරේෂන් හි අධ්‍යක්ෂ මණ්ඩලය

නම	තනතුර	පත්කල දිනය
ජොහාන් එස්. ප්‍රනාන්දු මයා	අධ්‍යක්ෂ	27/9/2012
ජනක පී.එම්. ගමගේ මයා	අධ්‍යක්ෂ	27/9/2012
අසංග සී. සෙනෙවිරත්න මයා	අධ්‍යක්ෂ	02/08/2011
රංජිත් තේනුවර මයා	අධ්‍යක්ෂ	11/11/2004
දොරෙයිසාමි ජීවනාදන් මයා	අධ්‍යක්ෂ	27/09/2012

නැෂනල් වෙල්ත් කෝපරේෂන් පුද්ගලික සමාගම

සහ අනුබද්ධ හා අශ්‍රිත සමාගම් සඳහා

2012.12.31 දිනට මූල්‍ය තත්වය

(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

	සටහන්	සමූහය 31/12/2012	සමාගම 31/12/2012
වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	7	5,540,906.00	118,819.00
මූල්‍ය වත්කම්			
ලාභාලාභ ගිණුම හරහා සාධාරණ අගයට ගැලපීම	8.1	3,157,179,525.00	210,540,441.00
ලැබිය යුතු ණය හා අත්තිකාරම්	8.2	688,772,517.00	21,153,912.00
කල්පිරෙන ආයෝජන	8.3	1,632,149,512.00	100,155.00
තැන්පතු, ඉදිරියට ගෙවීම් හා ලැබිය යුතු ගිණුම්	9	18,506,218.00	2,953,490.00
ආශ්‍රිත සමාගම් වල ආයෝජන			
නැට් වෙල්ත් සෙකුයුරිටීස් ආයතනය			273,600,000.00
බදු ගැලපීම්	11	1,072,389.00	968,387.00
දේපළ, පිරියත හා උපකරණ	12	1,737,989.00	1,559,309.00
මුළු වත්කම්		**5,504,959,056.00**	**510,994,513.00**
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධනය හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	13	300,000,070.00	300,000,070.00
විශේෂ සංචිත		149,975,522.00	-
රඳවාගත් ලාභය		98,033,183.00	188,162,814.00
මුළු හිමිකම්		**548,008,775.00**	**488,162,884.00**
වගකීම්			
නිදහස් කර ගත හැකි වරණීය කොටස්	14	200,000,000.00	
මූල්‍ය වගකීම්			
ණය හා ගෙවිය යුතු	15	4,669,093,384.00	
බැංකු අයිරාව	16	35,348.00	35,348.00
උපචිත හා අනෙකුත් ගෙවිය යුතු වියදම්		21,246,251.00	15,250,182.00
ආදායම් බදු වගකීම්	17	62,399,773.00	4,268,600.00
එකතු වූ සේවක ප්‍රතිලාභ	18	4,175,525.00	3,277,498.00
විලම්භිත ආදායම් බදු වගකීම	11	_	_
මුළු වගකීම්		**4,956,950,281.00**	**22,831,628.00**
මුළු හිමිකම් හා වගකීම්		**5,504,959,056.00**	**510,994,513.00**

නැෂනල් වෙල්ත් කෝපරේෂන් පුද්ගලික සමාගම
සහ අනුබද්ධ හා අශ්‍රිත සමාගම් සඳහා

විස්තීරණ ආදායම් වාර්තාව

(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

	සටහන්	සමූහය **31/12/2012**	සමාගම **31/12/2012**
ආයෝජන කළමණාකරණ ගාස්තු	19	8,683,246	8,683,246
ආයෝජන හා අනෙකුත් මෙහෙයුම් ආදායම්/(වියදම්)	20	(274,707,004)	61,537,676
ශුද්ධ ආයෝජන ආදායම		266,023,758	70,220,922
ගණුදෙණු වල සුරැකුම්පත් ප්‍රත්‍යාගණනය කිරීම නිසා සිදු වු ලාභ/අලාභ		150,293,622	(23,616,498)
අලෙවි හා ප්‍රවාරන වියදම්		(678,242)	(255,132)
පරිපාලන වියදම්		(57,308,489)	(13,614,530)
මූල්‍ය සේවා සඳහා එකතු කල අගය මත බදු		_	_
බදු පෙර ලාභය/(අලාභය)	21	(173,716,867)	32,734,762
ආදායම් බදු වියදම්	23	(1,676,747)	(1,676,747)
වාර්ෂික ලාභය /(අලාභය)		**(175,393,614)**	**31,058,015**
අනෙකුත් විස්තීරණ ආදායම්:			
ආගනනය කරන ලද එතතු වූ සේවක ප්‍රතිලාභ		(1,031,834)	(861,614)
එතතු වූ විශ්‍රාමික සේවක ප්‍රතිලාභ මත ගෙවු බදු		288,914	288,914
වර්ෂයේ අනෙකුත් විස්තීරණ ලාභ/අලාභ		742,920	(572,700)
මුළු විස්තීරණ (අලාභ)/වාර්ෂික ආදායම		**(176,136,534)**	**30,485,315**
කොටසක ඉපයීම /(අලාභය)			
මූලික	24	(5.87)	1.02
හායනික	24	(5.87)	1.02

කාර්යය මණ්ඩලය

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල අවම කාර්යය මණ්ඩල පිරිවැයක් දරන ආයතනයක් ලෙස එහි ආරම්භයේ සිටම ඉතා සීමිත කාර්යය මණ්ඩලයක් මගින් කටයුතු කරන අතර කාර්යය මණ්ඩල පරිපාලන වියදම ආදායමෙන් 0.26% ක් වූ අතර වියදමින් 0.40% වැනි ඉතා අවම මට්ටමක තබා ගත හැකි විය.

කාර්යය මණ්ඩලයෙහි දැනට පවතින ඇබැර්තු අභ්‍යන්තර උසස් කිරීම් මගින් පිරවීමටත් ඉන්පසු ඇතිවන තනතුරු සදහා ඇබැර්තු බාහිර අයදුම්කරුවන්ගෙන් පිරවීමටත් භාරකාර මණ්ඩලය තීරණය කර ඇත.

අත්සන් කලේ/ එම්. පරාක්‍රම බණ්ඩාර,
අධ්‍යක්ෂ වැ.බ.,
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (වෙනුවට)

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2012 දෙසැම්බර් 31

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
ඒකාබද්ධ ආදායම් වාර්තාව
දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

	සටහන්	සමූහය		අරමුදල	
		2012	**2011**	**2012**	**2011**
		රු.	රු.	රු.	රු.
ආදායම	9	1,508,784,172	1,595,744,687	1,434,725,736	1,203,129,252
සෘජු වියදම්	10	(900,453,437)	(881,915,885)	(729,611,070)	(773,617,762)
		608,330,735	713,828,802	705,114,666	429,511,490
අනෙකුත් ආදායම්	11	74,345,075	29,150,822	114,748,475	34,141,028
		682,675,810	742,979,624	819,863,140	463,652,518
පරිපාලන වියදම්	12	(481,977,059)	(414,760,351)	(73,065,213)	(16,564,628)
අලෙවි හා බෙදාහැරීමේ වියදම්	13	(22,862,906)	(13,598,904)	-	-
අනෙකුත් වියදම්	14	(25,508,270)	(13,688,072)	-	-
		152,327,575	**300,932,296**	**746,797,928**	**447,087,890**
මූල්‍ය ආදායම්	15	219,304,200	119,975,892	22,721	36,325
මූල්‍ය වියදම්	16	(431,246,562)	(227,597,407)	(27,900,511)	-
		(211,942,362)	(107,621,515)	(27,877,790)	36,325
ආශ්‍රිත සමාලම් වල ලාභ කොටස		947,189,322	687,783,871	-	-
අඩු කලා: ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වියදම්		(49,038,600)	(75,547,623)	-	-
		898,150,722	612,236,248	-	-
බදු පෙර ලාභ/අලාභ		**838,535,935**	**805,547,029**	**718,920,138**	**447,124,214**
බදු වියදම්	17	(14,619,306)	(55,203,016)	-	-
බදු පසු ලාභය		**823,916,629**	**750,344,013**	**718,920,138**	**447,124,214**
ශුද්ධ ලාභය - කොටස්					
අයිතිකරුවන්ගේ ලාභ කොටස		817,698,686	747,747,739	718,920,138	447,124,214
සුළු කොටස් හිමියන්ගේ ලාභය		6,217,943	2,596,274	-	-
		823,916,629	**750,344,013**	**718,920,138**	**447,124,214**

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
ඒකාබද්ධ විස්තීරණ ආදායම් වාර්තාව
දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

	සමූහය		අරමුදල	
	2012	**2011**	**2012**	**2011**
	රු.	රු.	රු.	රු.
බදු පසු ලාභය	**823,916,629**	**750,344,013**	**718,920,138**	**447,124,214**
අනෙකුත් විස්තීරණ ආදායම්				
AFS අනුව සාධාරණ අගය වෙනස් වීම	(51,957,307)	(157,103,432)	(51,957,307)	(157,103,432)
ආගනනය කරන ලද එතතු වූ සේවක ප්‍රතිලාභ	(737,011)	1,348,543	(322,049)	1,758
එතතු වූ විශ්‍රාමික සේවක ප්‍රතිලාභ මත ගෙවූ බදු	288,914	5,058	-	-
වාර්ෂික මුළු විස්තීරණ ආදායම්, ශුද්ධ බදු	**(52,405,404)**	**(155,749,831)**	**(52,279,356)**	**(157,101,674)**
වාර්ෂික මුළු විස්තීරණ ආදායම්	**771,511,225**	**594,594,183**	**666,640,782**	**290,022,541**
මුළු විස්තීරණ ආදායම - කොටස්				
අයිතිකරුවන්ගේ කොටස	765,293,282	591,997,909	666,640,782	290,022,541
සුළු කොටස් හිමියන්ගේ කොටස	6,217,943	2,596,274	-	-
	771,511,225	**594,594,183**	**666,640,782**	**290,022,541**

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
ඒකාබද්ධ මූල්‍ය තත්ව වාර්තාව
දෙසැම්බර් 31 දිනට

	සටහන්	සමූහය			අරමුදල		
		2012	**2011**	**2011.01.01 දිනට**	**2012**	**2011**	**2011.01.01 දිනට**
වත්කම්		රු.	රු.	රු.	රු.	රු.	රු.
ජංගම නොවන වත්කම්							
දේපළ, පිරියත හා උපකරණ	18	591,014,886	453,508,878	470,766,863	5,867,116	1,486,423	900,904
දේපළ වල ආයෝජන	19	-	-	-	12,460,179	12,460,179	12,460,179
අස්පෘශ්‍ය වත්කම්	20	1,575,646	1,575,646	1,575,646	-	-	-
උප සමාගම් වල ආයෝජන	21	-	-	-	573,577,393	573,577,393	573,577,393
ආශ්‍රිත සමාගම් වල ආයෝජන	22	785,234,346	523,858,817	514,197,382	2,200,000	2,200,000	2,200,000
විලම්භිත බදු වත්කම්		1,072,389	756,294	-	-	-	-
ජංගම නොවන මූල්‍ය වත්කම්	23	9,015,986,222	5,822,458,902	4,176,736,590	7,030,162,356	5,704,781,117	4,137,031,119
		10,394,883,489	6,802,158,537	5,163,276,481	7,624,267,045	6,294,505,111	4,726,169,594
ජංගම වත්කම්							
ජංගම මූල්‍ය වත්කම්	23	4,055,636,451	8,948,954,698	11,360,127,942	100,846,167	743,909,204	2,045,804,505
කලින් කරන ලද ගෙවීම් සහ අනෙකුත් ලැබිය යුතු ගිණුම්	24	86,943,379	42,965,670	39,740,515	284,877,573	199,368,073	199,028,481
මුදල් සහ මුදල් සමාන දෑ	25	206,139,089	126,228,538	184,566,710	2,067,999	14,695,633	16,791,497
		4,348,718,919	9,118,148,906	11,584,435,167	387,791,740	957,972,910	2,261,624,482
මුළු වත්කම්		**14,743,602,410**	**15,920,307,443**	**16,747,711,647**	**8,012,058,786**	**7,252,478,023**	**6,987,794,077**
හිමිකම් සහ වගකීම්							
හිමිකම්							
මූලික දායකත්වය		1,462,250	1,462,250	1,462,250	1,462,250	1,462,250	1,462,250
රඳවාගත් ලාභය		9,297,728,939	8,480,478,349	7,755,301,995	8,010,887,878	7,292,289,789	6,845,163,816
අනෙකුත් සංචිත		425,708,664	422,451,399	545,372,580	(116,666,492)	(64,709,185)	92,394,247
		9,724,899,853	8,904,391,998	8,302,136,825	7,895,683,636	7,229,042,854	6,939,020,313
සුළු කොටස්හිමියන්ගේ අයිතිය		16,591,850	10,752,747	8,805,913	-	-	-
		9,741,491,703	8,915,144,745	8,310,942,738	7,895,683,636	7,229,042,854	6,939,020,313
ජංගම නොවන වගකීම්							
විලම්භිත බදු වගකීම		-	-	2,092,024	-	-	-
විලම්භිත ආදායම්		1,118,655	1,118,655	1,118,655	-	-	-
එකතු වූ විශ්‍රාමික සේවක ප්‍රතිලාභ	26	32,121,464	25,473,166	21,095,069	378,905	158,038	132,144
		33,240,119	26,591,821	24,305,748	378,905	158,038	132,144
ජංගම වගකීම්							
විලම්භිත ආදායම්		5,434,578	8,036,993	10,667,067	-	-	-
අනෙකුත් වගකීම්	27	4,731,441,556	6,745,321,900	8,100,421,127	112,209,454	767,705	751,942
උපචිත සහ අනෙතකුත් ගෙවිය යුතු ගිං	28	167,724,789	142,549,332	205,824,860	1,952,248	3,570,467	3,982,180
වෙන් කිරීම්	29	1,834,546	18,938,962	43,907,496	1,834,546	18,938,962	43,907,496
ආදායම් බදු වගකීම		62,399,773	63,723,691	51,642,611	-	-	-
බැංකු අයිරාව		35,348	-	-	-	-	-
		4,968,870,590	6,978,570,877	8,412,463,162	115,996,247	23,277,134	48,641,619
මුළු හිමිකම් සහ වගකීම්		**14,743,602,410**	**15,920,307,443**	**16,747,711,647**	**8,012,058,786**	**7,252,478,023**	**6,987,794,076**

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
ඒකාබද්ධ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

	සමූහය										අරමුදල			
	මූලික දායකත්වය	රඳවාගත් ඉපයීම්	විශේෂ සංචිතය	මිල සංචිත ගිණුම	ආරක්ෂණ සංචිතය	අසම්භාව්‍ය අරමුදල	පරිත්‍යාග අරමුදල	එකතුව	සුළු කොටස් හිමියන්ගේ අයිතිය	මුළු අරමුදල හා සුළු කොටස් හිමියන්ගේ අයිතිය	මූලික දායකත්වය	රඳවාගත් ඉපයීම්	ආරක්ෂණ සංචිතය	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය	1,462,250	7,755,301,995	133,072,658	313,497,021	92,394,247	6,000,000	408,654	8,302,136,825	8,805,913	8,310,942,738	1,462,250	6,845,163,816	92,394,247	6,939,020,313
2011 ජනවාරි 01 දිනට ශේෂය	1,462,250	7,755,301,995	133,072,658	313,497,021	92,394,247	6,000,000	408,654	8,302,136,825	8,805,913	8,310,942,738	1,462,250	6,845,163,816	92,394,247	6,939,020,313
විශේෂ සංචිතයට මාරු කිරීම	-	(16,902,864)	16,902,864	-	-			-		-	-	-	-	-
පෙර වර්ෂයේ ගැලපීම්	-	(7,022,122)	-	-	-	5,996,421	1,025,701	-		-	-	-		-
වර්ෂය තුල වෙන්කිරීම්	-	-	-	9,342,473	-	854,924	59,867.30	10,257,264		10,257,264	-	-		-
වාර්ෂික ලාභය	-	747,747,739	-	-	-	-		747,747,739	2,596,274	750,344,013	-	447,125,973		447,125,973
අනෙකුත් වාර්ෂික විස්තීරණ ආදායම්	-	1,353,601	-	-	(157,103,432)			(155,749,831)	-	(155,749,831)	-	-	(157,103,432)	(157,103,432)
ගෙවූ ලාභාංශ	-	-	-	-	-	-	-	-	(649,440)	(649,440)	-	-	-	-
2011 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,462,250**	**8,480,478,349**	**149,975,522**	**322,839,494**	**(64,709,185)**	**12,851,346**	**1,494,222**	**8,904,391,998**	**10,752,747**	**8,915,144,745**	**1,462,250**	**7,292,289,789**	**(64,709,185)**	**7,229,042,854**
2012 ජනවාරි 01 දිනට ශේෂය	1,462,250	8,480,478,349	149,975,522	322,839,494	(64,709,185)	12,851,346	1,494,222	8,904,391,998	10,752,747	8,915,144,745	1,462,250	7,292,289,789	(64,709,185)	7,229,042,854
වර්ෂය තුල වෙන්කිරීම්	-	-	-	53,778,757	-	1,373,676	62,140	55,214,573	-	55,214,573	-	-	-	-
වාර්ෂික ලාභය	-	817,698,686	-	-	-	-	-	817,698,686	6,217,943	823,916,629	-	718,598,089		718,598,089
අනෙකුත් වාර්ෂික විස්තීරණ ආදායම්	-	(448,097)	-	-	(51,957,307)	-	-	(52,405,404)	-	(52,405,404)	-	-	(51,957,307)	(51,957,307)
ගෙවූ ලාභාංශ	-	-	-	-	-	-	-	-	(378,840)	(378,840)	-	-	-	-
2012 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,462,250**	**9,297,728,939**	**149,975,522**	**376,618,251**	**(116,666,492)**	**14,225,021**	**1,556,362**	**9,724,899,853**	**16,591,850**	**9,741,491,703**	**1,462,250**	**8,010,887,878**	**(116,666,492)**	**7,895,683,636**

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

	සමූහය		අරමුදල	
	2012	**2011**	**2012**	**2011**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය				
වාර්ෂික ශුද්ධ ලාභය	**838,535,935**	**805,547,029**	**718,920,138**	**447,124,214**
ගැලපීම්;				
ක්ෂය	73,155,190	66,504,886	842,027	243,756
ආශ්‍රිත සමාගම් වල ආයෝජන වල අඩු වීම	90,107,550	86,917,285	-	-
ලාභාංශ ආදායම	(3,527,258)	(743,000)	(36,000,000)	-
ආශ්‍රිත සමාගම් වලින් ලද ලාභ	(898,150,722)	(612,236,248)	-	-
දේපළල පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ	(389,371)	(105,154)	-	-
පරිත්‍යාග අරමුදල සඳහා වෙන් කිරීම්	62,140	59,867	-	-
අසම්භාව්‍ය අරමුදල සඳහා වෙන් කිරීම්	1,373,676	854,924	-	-
පාරිතෝෂික වියදම්	7,317,680	6,310,909	68,858	27,652
	(730,051,114)	(452,436,530)	(35,089,116)	271,408
බදු ගෙවීම්	(15,970,405)	(45,965,196)	-	-
ශුද්ධ මුදල් ප්‍රවාහය/කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වූ මුදල් ගලා යෑම්	**92,514,416**	**307,145,303**	**683,831,022**	**447,395,622**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්				
ලැබිය යුතු ගිණුම් වල වැඩි වීම / අඩු වීම	(43,977,711)	(3,225,155)	(85,509,500)	(339,594)
ණය හිමියන්ගේ වැඩි වීම / අඩු වීම	25,175,456	(63,275,529)	(1,618,220)	(411,715)
වෙන් කිරීම් වල වැඩි වීම / අඩු වීම	(17,104,416)	(24,968,535)	(17,104,415)	(24,968,536)
	(35,906,671)	(91,469,218)	(104,232,135)	(25,719,845)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම්/ ගලා යෑම්	**56,607,745**	**215,676,085**	**579,598,888**	**421,675,778**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය				
දේපළ , පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම	(211,374,082)	(49,387,202)	(5,222,720)	(829,275)
දේපළල පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ලද මුදල්	1,102,254	245,454	-	-
විලම්භිත ආදායම්	(2,602,415)	(2,630,074)	-	-
ආශ්‍රිත සමාගම් වලින් ලද ලාභ	600,446,400	525,000,000	-	-
මූල්‍ය වත්කම් වල ආයෝජනය	(366,046,724)	(746,751,727)	(622,833,762)	(422,942,366)
ලාභාංශ ආදායම	3,527,258	743,000	36,000,000	-
පාරිතෝෂික ගෙවීම්	(1,406,393)	(584,268)	(170,040)	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම්/ ගලා යෑම්	**23,646,299**	**(273,364,817)**	**(592,226,522)**	**(423,771,641)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය				
ලාභාංශ ගෙවීම්	(378,840)	(649,440.00)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම්/ ගලා යෑම්	**(378,840)**	**(649,440)**	-	-
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වෙනස්වීම	**79,875,203**	**(58,338,172)**	**(12,627,634)**	**(2,095,864)**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	126,228,538	184,566,710	14,695,633	16,791,497
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන 25)	**206,103,741**	**126,228,538**	2,067,999	**14,695,633**

1. සංස්ථාපිත තොරතුරු

1.1 සාමාන්‍ය

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (භාර අරමුදල) යනු 1981 අංක 66 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත භාර අරමුදලක් වන අතර එහි කළමනාකරණය සහ පාලනය භාරකාර මණ්ඩලයක් මගින් සිදු කෙරේ. එය කොළඹ 02වෝක්ෂෝල් වීදියේ අංක 27 දරණ CWE ලේකම් ගොඩනැගිල්ලෙහි 6 වන මහලෙහි පිහිටා ඇත.

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2012 වසරේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන භාර අරමුදලෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ආදායම් ප්‍රකාශ, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශ, මූල්‍ය ස්ථාවර ප්‍රකාශය , මුදල් සංසරණ ප්‍රකාශය, සාධාරණත්ව වෙනස්කම්පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රකාශයට අදාළ සටහන් සහ සමූහයේ සුවිශේෂි ගිණුම් ප්‍රතිපත්ති යනාදියෙන් සමන්විත වෙයි.

1.3 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ස්වාභාවයන්

1.3.1 මහපොළ භාර අරමුදල

අරමුදලේ ප්‍රධාන ඉලක්ක සහ අරමුණු වනුයේ -

(අ) තරුණයන් සඳහා උසස් අධ්‍යාපන පහසුකම් සැපයීම

(ආ) ද්විතීයික අධ්‍යාපනය සාර්ථක ලෙස නිම කළ සුදුසුකම් ලත් තරුණයන්ට අවස්ථානුකූල පරිදි විශ්වවිද්‍යාලයක හෝ තාක්ෂණික ආයතනයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක සිය අධ්‍යාපනික, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට සහාය ලබා දීම.

(ඇ) තරුණයන්ට ස්වකීය වෘත්තීයමය නිපුණතා සහ විභව්‍යතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන සේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටු වීම සහ පිහිටු වීමට හා කළමනාකරණය කිරීමට ආධාර කිරීම

(ඈ) අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට අදාළ පාසල්, ආයතන, පදනම් සහ එවැනි ආයතන කළමනාකරණය හා පාලනය සඳහා සහාය දීම; සහ

(ඉ) අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ කාර්යයෙහි නියැලෙන කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි පුද්ගලයන්ගේ නිපුණතා සහ විභව්‍යතා සංවර්ධනය හා වැඩිදියුණු කිරීමට සහාය දීම යනාදියයි.

1.3.2 අනුකාරක සහ හවුල් සමාගම්වල කොටස්කරණය

2012 දෙසැම්බර් 31, 2011 දෙසැම්බර් 31 හා 2011 ජනවාරි 1 වැනි දින වන විට අනුකාරක සහ හවුල්කාර සමාගම් සහ ඔවුන්ගේ හිමිකම් පහත දැක්වේ.

අනුකාරක සමාගම්	ප්‍රධාන ක්‍රියාකාරම්	ආයෝජන ආකාරය	2012 දෙසැම්බර් 31	2011 දෙසැම්බර් 31	2011 ජනවාරි 1
ජාතික වත්කම් සංස්ථාව (පුද්ගලික) සමාගම (NWCL)	අරමුදල් කළමනාකරණය හා ආයෝජනය පිළිබඳ උපදේශනය	අනුකාරක	100%	100%	100%
ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (සහතික ලත්) (SLIIT)	පරිගණක, ව්‍යාපාර හා ඉංජිනේරු උපාධි, ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා සැපයීම	අනුකාරක	100%	100%	100%
ශුද්ධ වත්කම් සුරැකුම් (පුද්ගලික) සමාගම.	ප්‍රාථමික ගනුදෙනු කරුවන් වශයෙන් කටයුතු කිරීම.	උප අනුකාරක	100%	100%	100%
SLIIT පරිගණක(පුද්ගලින) සමාගම	තොරතුරු තාක්ෂණයට අදාළව විෂය මාලා සැපයීම	උප අනුකාරක	72.9%	72.9%	72.9%
ශ්‍රී ලංකා තාක්ෂණික උත්පාදන (පුද්ගලික) සමාගම	ආරම්භ කරන ලද සමාගම් හා ව්‍යවසාය සඳහා තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථාන ප්‍රවර්ධනය හා ඒවාට අනුග්‍රහය දැක්වීම	උප අනුකාරක	63.9%	63.9%	63.9%
සංවර්ධන ලොතරැයි මණ්ඩලය	අරමුදල තර කිරීම සඳහා ලොතරැයි දිනුම් ඇදීම	හවුල්	50%	50%	50%

2. සකස් කිරීමේ පදනම

2.1 2012 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන මූල්‍ය කාලය සඳහා ක්‍රියාත්මක SLAS හි පදනම සකස් කිරීම සහ සම්මත කිරීම

2012 වසරේ දෙසැම්බර් 31 වැනි දිනසෙහ එම වසරෙන් අවසන් වන භාර අරමුදලට අයත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ආදායම් ප්‍රකාශ, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශ, මූල්‍ය ස්ථාවර ප්‍රකාශය , මුදල් සංසරණ ප්‍රකාශය, සාධාරණත්ව වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රකාශයට අදාළ සටහන් සහ සමූහයේ සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති එනම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සහ භින්න මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් ඉදිරිපත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුව (SLFRS/LKAS) සකස් කර තිබේ.

2011 දෙසැම්බර් 31 න් අවසන් වන සහ ඒ දක්වා වූ ඕනෑම කාලයක් සඳහා 2012 ජනවාරි මස 1 වැනි දිනට පෙර බල පැවැත්වූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් ප්‍රකාරව භාර අරමුදල මගින් තනි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශන සමූහමය මූල්‍ය ප්‍රකාශනවල ප්‍රථම ගොනුව වන අතර SLFRS ප්‍රකාරව සකස් කර ඇති මුල්ම අවස්ථාව ද මෙය වේ. මෙම තත්ත්වය මාරු වීම පිළිබඳ පැහැදිලි කිරීම සඳහා 7 වැනි සටහන බලන්න.

2.2 ගණනය කිරීමේ පදනම

විශේෂයෙන් සඳහන් කර නැත්තේ නම් මිස ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සහ ලැබීම් පදනම යටතේ මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබ තිබේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ.

2.3 සංසන්දනාත්මක තොරතුරු

නව SLFRS භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් විය යුතු මූල්‍ය ප්‍රකාශන හැර ඉතිරිය සඳහා භාර අරමුදල සහ සමූහය විසින් නිත්‍ය වශයෙන් මූල්‍ය ප්‍රකාශන LKAS 01 ඉදිරිපත් කිරීම්වලට අනුකූල වූ පූර්ව මූල්‍ය වර්ෂයේ ගිණුම් ප්‍රතිපත්ති භාවිතා කරන ලදී.තවද වත්මන් ඉදිරිපත්කිරීම් සමග අනුකූල විය යුතු කවර අවස්ථාවක දී වුව ද සංසන්දනාත්මක තොරතුරු යළි වර්ගීකරණය කරන ලදී.

2.4 වැදගත් තීන්දු

සමූහ ගිණුම් ප්‍රතිපත්ති ආදේශ කිරීමේ ක්‍රියාවලියේ දී කළමනාකරණය විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු ලැබූ ප්‍රමාණ මත වඩාත් විශේෂ බලපෑමක් ඇති කළ හැකි පහත සඳහන් තීන්දුවලට එළැඹිණ.

i) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය **(SLIIT)** අනුකාරක සමාගම් සමාගමක් වශයෙන් නිර්ණය කිරීම

1999.05.21 දින සහ 1999.09.02 දින පැවති රැස්වීම්වලදී(32වන සහ 33 වන මණ්ඩලරැස්වීම්), භාර අරමුදලේ භාරකාර මණ්ඩලය සම්පත් සැපයීම මගින් සහතික වනු ලැබ SLIITආයතනය සීමා සහිත සමාගමක් වශයෙන් ස්ථාපිත කිරීමට තීරණය කර ගන්නා ලදී.එ බැවින් පහත කරුණු මත පදනම් ව SLIIT යනු LKAS 27 විෂය පථය තුළ භාර අරමුදලෙහි අනුකාරක සමාගම්සමාගමක් වශයෙන් හඳුන්වනු ලැබේ.

- SLIIT යනු අභ්‍යන්තර වෙළඳ, අන්තර්ජාතික වාණිජ හා ආහාර අමාත්‍යංශයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගිතා ප්‍රයත්නයක් වශයෙන් ස්ථාපිත කරන ලද්දක් වන අතර එහි ආයෝජනය කිරීමට හා සම්පත් සැපයීමට භාර අරමුදල එකඟ වී ඇත.
- ආයතනය ආරම්භයේ සිටම එහි ආධාරවලින් වැඩි ප්‍රමාණය සපයන ලද්දේ භාර අරමුදල විසිනි
- SLIIT හි පාලනය පිළිබඳ නිර්ණායකයන් නිශ්චය කිරීමේ දී භාර අරමුදල පහත සාධක සලකා බලන ලදී.
- SLIIT මණ්ඩලයෙහි නියෝජනය
- SLIIT(ප්‍රතිලාභ) ඔස්සේ භාර අරමුදලේ ඉලක්ක සපුරාගැනීම
- භාර අරමුදල සහ SLIIT අතර ගිවිසුමෙන් SLIIT සඳහා මාලඹේ ඉඩම භාවිතා කිරීමේ

අයිතිය ලබා දෙන අතර ගිවිසුමෙහි සඳහන් ඇතැම් විශේෂ කොන්දේසි මගින් SLIIT සඳහා මුලින් අනුමත කර ඇති සමාගම් ව්‍යවස්ථාවට යටත්ව එහි ප්‍රධාන මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් බලපෑම් කිරීමට ගිවිසුම මගින් භාර අරමුදලට බලය පැවරේ.

- ගිවිසුමෙහි 4වන වගන්තිය

(අ) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි ඉලක්ක සහ සමාජ වගකීම්වලට කවර ආකාරයක්න් හෝ පටහැනි වන සේ ක්‍රියා නොකිරීමට SLIIT සහතික වන අතර මාලඹේ හි SLIIT පීඨයෙහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීමට MTF ට හැකියාව ඇති අතර එකී නිර්දේශ සලකා බැලීමට SLIIT හැකියාව ඇත.

(ආ) SLIIT හි ප්‍රධාන සිවිල් ඉදිකිරීම් කටයුතු MTF හා සහයෝගිතාවයෙන් ඉටු කළ යුතු ය.

(ඇ) SLIIT විසින් තම දිගු කාලීන සංවර්ධන සැලැස්ම MTF හි දැන ගැනීම හා සහයෝගිතාව පිණිස ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) අධ්‍යයන පාඨමාලාවල ගුණාත්මක භාවය සහ ප්‍රමිතිය සෑම කල්හිම පවත්වා ගෙන යනු ලබන බවට SLIIT ආයතනය සහතික වන අතර පීඨ බලධාරීන්ට එරෙහි පැන නැගිය හැකි කවර හෝ නීතිමය වගකීමක දී MTFවෙත වන්දි පූරණය සහතික කරනු ලැබේ.

(එ) මාලඹේ පීඨයේ ගැටළුවලට අදාළව සමාගම් ව්‍යවස්ථාව සම්බන්ධව කවර හෝ සංශෝධනයක් ඇත්නම් එය සිදු කිරීමේ දී SLIIT අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින සියලුම MTF නියෝජිතයන්ගේ එකඟත්වය ලබා ගත යුතු ය.එවැනි එකඟතාවක් නොපවතින අවස්ථාවක් ඇති වුවහොත් MTF හි එකඟත්වය ලබා ගත යුතු ය.

i) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ (DLB) ආයෝජන සමාගමේ ආයෝජන වශයෙන් නිර්ණය කිරීම

.

පහත සඳහන් කරුණු පදනම් කර ගනිමින් LKAS 28 හි විෂය පථය තුළ DLB යනු භාර අරමුදලේ සමාගමක් බව භාර අරමුදලේ භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත.

- DLBහි ප්‍රාග්ධන අවශ්‍යතාවෙන් 50%ක් භාර අරමුදල මගින් දායක කරනු ලැබ තිබේ.
- DLB. DLB හි මණ්ඩලයේ නියෝජනය

3. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

භාර අරමුදල සහ ක්‍රියාකාරී සමූහය මගින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශනවල භාවිතා කරනු ලබන වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පහතින් ඇතුළත් කර තිබේ.පහත දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශ නිබන්ධන ඉදිරිපත් කරන ලද සෑම කාලයකටම නිත්‍ය වශයෙන් ආදේශ කරනු ලැබ ඇති අතර සඳහන් කර නොමැත්තේ නම් මිස ආරම්භක SLFRS ප්‍රකාශය සකස් කිරීමේ දී SLFRSට මාරු කිරීමේ කාර්යය සඳහා 2011 ජනවාරි 1 වැනි දින මූල්‍ය තත්ත්වය ආදේශ කෙරේ.

3.1 ඒකාබද්ධතාව සඳහා පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල 2012 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ සහ එහි අනුකාරක සමාගම්වල මූල්‍ය ප්‍රකාශන අන්තර්ගත වෙයි.

අනුකාරක සමාගම් මුළුමනින්ම ඒකාබද්ධ වන අතර ඒකාබද්ධතාව අඛණ්ඩව පවත්වාගෙන යාමට ද නියමිතය. අනුකාරක සමාගම්වල මූල්‍ය ප්‍රකාශ ස්ථාවර ගිණුම් ප්‍රතිපත්ති භාවිතා කරමින් මව් සමාගමේ වාර්තාව සකස් කරන කාලයේ දීම සකස් කරනු ලැබේ. සියලුම අන්ත: සමූහ ඉතුරුම්,ගණුදෙනු,උපලබ්ධි නොවූ ලැබීම් සහ අන්ත: සමූහ ගනුදෙනු සහ බෙදීයාම් මුළුමනින්ම ඉවත් කෙරේ.

3.2 සමාගම තුළ ආයෝජනය

සමාගමේ සමූහ ආයෝජනය සාධාරණත්ව ක්‍රමයක් භාවිතා කරමින් ගණනය කෙරේ.සමාගමක් යනු සමූහයකට සැලකිය යුතු බලපෑමක් කළ හැකි ආස්ථිත්‍යයකි.
.සාධාරණත්ව ක්‍රමය යටතේ සමාගමේ ආයෝජනය සිදු කරනු ලබන්නේ සමාගමේ ශුද්ධ වත්කමේ සමූහයට අයත් කොටස්වල පිරිවැය එකතුකළ පසු අත්පත් කිරීමේ වෙනස්කම්වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ය.
ආදායම් ප්‍රකාශය මගින් සමාගමේ මෙහෙයුම්වල ප්‍රතිඵල වශයෙන් වන කොටස් පිළිබිඹු කරයි.සමාගමේ සාධාරණත්ව කොටස්වල වෙනසක් සෘජුවම හඳුනාගනු ලැබුව හොත් කවර හෝ වෙනසක් සිදු වූ කොටස සමූහය විසින් හඳුනාගන්නා අතර එය යෝග්‍ය අවස්ථාවේදී සාධාරණත්ව කොටස් වෙනස්වීමේ ප්‍රකාශනය තුළ හෙළිදරවු කෙරේ.

3.3 දේපල පිරියත සහ උපකරණ

සමුච්ඡිත ක්ෂයෙහි සහ සමුච්ඡිත අපහායනමය පාඩුවෙහි පවතියි නම් ශුද්ධ පිරිවැය හි දේපල පිරියත සහ උපකරණ සඳහන් කෙරේ.එම පිරිවැයට දේපල පිරියත සහ උපකරණවල උපාංගමය කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට වැයවන පිරිවැයද අනුමත උපමාන සපුරාලන්නේ නම් දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා තාවකාලිකව පාවිච්චියට ගැනීමේ පිරිවැයද ඇතුළත් වෙයි. දේපල පිරියත සහ උපකරණවල වැදගත් කොටස් කාල අන්තරවලින් ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වන්නේ නම් සමූහය විසින් ප්‍රතිස්ථාපිත කොටස අනුමත නොකරන අතර නව කොටස ප්‍රයෝජ්‍ය ආයු කාලයක් සහ ක්ෂය ප්‍රමාණයක් සහිත එහිම ආවේණික කොටසක් වශයෙන් අනුමත කෙරේ. එසේ ම ප්‍රධාන පරීක්ෂණයක් සිදු කළ විට අනුමත උපමාන සංතෘප්ත වේ නම් ප්‍රතිස්ථාපනයක් වශයෙන් පිරියත සහ උපකරණවල ඉදිරියට ගෙන ආ ප්‍රමාණයෙහි එහි පිරිවැය සඳහන් කෙරේ.අනෙක් සියලු අලුත්වැඩියා සහ නඩත්තු කටයුතුවල පිරිවැය ආදායම් ප්‍රකාශයෙහි වැය බරක් ලෙස සඳහන් කෙරේ.

මුලින් අනුමත දේපල පිරියත සහ උපකරණයක අයිතමයක් සහ කවර හෝ වැදගත් කොටසක් අපහරණය හෝ එහි භාවිතයෙන් හෝ අපහරණයෙන් කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් අනාගතයේ දී අත් නොවන තත්ත්වයක් යටතේ අනුමත නොවන බවට පත්වේ.

එසේ අනුමත නොවීමෙන් වත්කම්වල (වත්කම්වල ශුද්ධ අපහරණ ලාභය හා ඉදිරියට ගෙන ආ වෙනස වශයෙන් ගණනය කරනු ලැබේ.) ඉස්මතු වන ලැබීමක් හෝ පාඩුවක් වත්කම් අනුමත නොවූ විට ආදායම් වාර්තාවෙහි අන්තර්ගත කෙරේ.

3.3.1 ක්ෂය ප්‍රමාණය

ක්ෂය ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ සියලුම දේපල පිරියත හා උපකරණවල ප්‍රයෝජ්‍ය ආයු කාලය ඇස්තමේන්තු මත ඍජු රේඛීය පදනමකටය.
කණ්ඩායම් සඳහා පවත්නා සහ සංසන්දනාත්මක වසර සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත පරිදි වේ.

උපකරණ	වසර 4 සිට 5 දක්වා
මෝටර් රථ	වසර 4 සිට 5 දක්වා
පරිගණක පරිගණක උපාංග සහ මෘදුකාංග	වසර 3 සිට 4 දක්වා
ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්	වසර 2 සිට 5 දක්වා
ගොඩනැගිලි	වසර 10 සිට 20 දක්වා
පොත් සහ උපාධිධාරී ඇඳුම් කට්ටලය	වසර 3 සිට 5 දක්වා

3.3.2 ආයෝජන දේපල

ආයෝජන දේපල ගණනය කරනු ලබන්නේ ගනුදෙනු පිරිවැය ද ඇතුළුව මූලික පිරිවැය සඳහාය.ආරම්භක අනුමතකරණයට අනතුරුව සිදු කරනු ලබන අනුමත කිරීම් ද පිරිවැයෙහි සඳහන් කෙරේ.

යම් දේපලක් අනුමත නො කර ඇති විට හෝ ආයෝජන දේපල ස්ථිර ලෙසම භාවිතයෙන් ඉවත් කර ඇත්නම් සහ එය අනුමත නො කිරීමෙන් කිසිදු අනාගත ආර්ථිකමය ලාභයක් අපේක්ෂා නොකරන්නේ නම් එය ආයොජන දේපලක් වශයෙන් නො පිළිගැනේ.ශුද්ධ බැහැර කිරීමේ ලාභ කටයුතු සහ වත්කම් ඉදිරියට ගෙන යාමේ ප්‍රමාණය නොපිළිගනු ලබන කාලය සඳහා ආදායම් වාර්තාවෙහි සඳහන් කෙරේ.

3.3.3 මූල්‍ය නොවන වත්කම් අඩු කිරීම

එක් එක් වාර්තා කළ යුතු දිනයේ දී වත්කම් අඩු කළ හැකි ද යන්න සමූහය විසින් තක්සේරු කරනු ලැබේ. එවැනි සඳහනක් වුවහොත් හෝ වත්කම් සඳහා වාර්ෂික අඩුකිරීමේ පරීක්ෂණයක් අවශ්‍ය වුවහොත් සමූහය විසින් වත්කමෙහි යථා තත්ත්වයට පත් කළ හැකි මුදල තක්සේරු කරනු ලැබේ. වත්කමෙහි යථා තත්ත්වයට පත්කළ හැකි ප්‍රමාණය වන්නේ විකිණීම සඳහා වත්කමේ හෝ මුදල් කළ හැකි ඒකකවල(CGU)සාධාරණ වටිනාකම අඩු කළ පිරිවැය සහ එහි භාවිත වටිනාකම යන දෙකෙන් ඉහළ අගය වන අතර වත්කම මගින් වෙනත් වත්කම් හා සමූහ වත්කම්වලින් පුළුල් වශයෙන් ස්වාධීන වන මුදල් ගලනයක් උත්පාදනය නොවන්නේ නම් තනි වත්කමක් සඳහා නිර්ණය කෙරේ. වත්කමක ඉදිරියට ගෙන ආ ප්‍රමාණය හෝ CGU එහි යථා තත්ත්වයට පත් කළ හැකි ප්‍රමාණය ඉක්මවා යයි නම් වත්කම ක්‍රමක්ෂය වී ඇති සේ සලකනු ලබන අතර එය යථා තත්ත්වයට පත්කළ හැකි ප්‍රමාණය යටතේ ලේඛන ගත කෙරේ.භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේ දී ඇස්තමේන්තු කරනු ලැබූ අනාගත මුදල් ගලනය ඒවායෙහි මුදලෙහි කාලීන අගයේ පවත්නා වෙළඳපොළ තක්සේරු වටිනාකම් සහ වත්කමට පමණක් අදාළ වූ අවදානම් පෙන්නුම් කරන පූර්ව බදු වට්ටම් අනුපාතයක් භාවිතයෙන් වත්මන් වටිනාකමට අඩු කරනු ලැබේ.විකිණීමේ අඩු පිරිවැය සාධාරණ වටිනාකම තීරණය කිරීමේ දී ආසන්න කාලීන වෙළඳපොළ ගණුදෙනු තිබේ නම් ඒවා සැලකිල්ලට භාජනය කෙරේ.එවැනි ගනුදෙනු හඳුනාගත නොහැකි නම් සුදුසු තක්සේරු දර්ශයක් භාවිත කෙරේ.

3.3.4 විදේශ මුදල්

a) ක්‍රියාත්මක හා ව්‍යවහාර මුදල්

කණ්ඩායමේ මූල්‍ය ප්‍රකාශයේ අන්තර්ගත අයිතම ගණනය කරනු ලබන්නේ ආස්ථිතය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයෙහි මුදල් ඒකක භාවිතයෙනි(ක්‍රියාත්මක මුදල් .ඒකබද්ධ මූල්‍ය ප්‍රකාශ කණ්ඩායමේ සහ සමාගමේ ක්‍රියාත්මක හා ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ.)

b) ගනුදෙනු සහ ඉතුරුම්

විදේශ මුදල් ගනුදෙනු එම ගනුදෙනු කරන දිනයට පවතින විනිමය මුදල් අනුපාතය භාවිතා කරමින් ක්‍රියාමය මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. එකී ගනුදෙනු පියවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සහ විදේශ ව්‍යවහාර මුදල් මගින් පාලනය වන සුළු වත්කම් හා බැදීම්වලට අදාළ වසර අග විනිමය අනුපාතවල ගනුදෙනුවලින් සිදුවන විදේශ හුවමාරු ප්‍රදාන සහ පාඩු සම්මුච්චිත ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ. සුළු වත්කම් සහ ණය තුරුස් ඉතුරුම් වසර අග විනිමය අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ.

3.3.5 බදුකරණය
3.3.5.1 වත්මන් බදුකරණය

දැනට පවත්නා සහ ඉන් පෙර කාලයට අදාළ මූල්‍ය ආදායම් බදු සහ ණය තුරුස් ගණනය කරනු ලබන්නේ යළි ලබා ගැනීමට අපේක්ෂිත මුදල හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවීමට අපේක්ෂිත මුදලට සාපේක්ෂවය.එකී මුදල ගණනය කිරීම සඳහා භාවිතා කරනු ලබන්නේ වාර්තා කළ දින හෝ ඒ වන විට බලාත්මකව පැවති බදු අනුපාතයන් සහ බදු නීතින්ය.

සමූහය සඳහා ආදායම් බදු වාර්තාවලට අදාළ විධිවිධානවල පදනම පහත පරිදි වෙයි.

අ) මහපොළ භාර අරමුදල
1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත අනුව භාර අරමුදල ආදායම් බදු වලින් නිදහස් වෙයි.

ආ) සීමාසහිත ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (සහතික ලත්) ආයතනය
මෙය,BOI මගින් නිශ්චය කරනු ලැබිය හැකි තක්සේරු වර්ෂයක සිට සලකනු ලබන පස් වසරක කාලයක් සඳහා BOI ගිවිසුමෙහි සඳහන් කර ඇති ව්‍යාපර කටයුතුවලට බදු නිවාඩු දිනයක් භුක්ති විඳිය හැකි ආයෝජන මණ්ඩලයේ (BOI) අනුමැතිය ලත් සමාගමකි.
ඉහත කී කාර්යය උදෙසා තක්සේරු වර්ෂය වශයෙන් සලකනු ලැබ තිබෙන්නේ මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ සහතිකයෙහි සඳහන් පරිදි ව්‍යාවසාය විසින් පළමුවරට වාණිජ කටයුතු සිදු කරනු ලැබූ දිනයයි(2002 ජනවාරි 10 වැනි දින).
ඉහත නිදහස් කළ කාලය 2007 සැප්තැම්බර් මස 25 වැනි දින BOI සමග ඇතුළත් වූ අනුකාරක සමාගම් ගිවිසුම මගින් 2014 ජනවාරි 10 වැනි දින දක්වා (තවත් වසර 7කට)දීර්ඝ කරන ලදී
වසර 7 ක බදු නිදහස් කාලය ඉකුත් වීමෙන් පසු එළැඹෙන ඉදිරි සෑම තක්සේරු වසරක් සඳහාම ආයතනය විසින් ඉහත අනුකාරක සමාගම් ගිවිසුම යටතේ 15%ක අනුපාතයකින් ආදායම් බදු ගෙවිය යුතුය.

ඇ) ජාතික වත්කම් සංස්ථාව(පුද්ගලික)සමාගම
ආදායම් බදු සැපයුම, මූල්‍ය ප්‍රකාශනයෙහි වාර්තා වී ඇති ආකාරයට ආදායම් සහ වියදම් මූලිකාංග මත පදනම් වන අතර 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත හා එහි සංශෝධනවල විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලැබේ.

3.3.5.2 ප්‍රමාද වූ බදු

මූල්‍යමය වාර්තාකරණ කාර්යය උදෙසා වත්කම්වල සහ ණය තුරුස්වල බදු පදනම සහ ඒවායෙහි ඉදිරියට ගෙන ආ ප්‍රමාණ අතර වාර්තා කරනු ලබන දිනයේ දී පවතින තාවකාලික වෙනස්කම් මත ගෙවීම් ක්‍රමයක් භාවිතයෙන් ප්‍රමාද වූ බදු අය කරනු ලැබේ.

බදු අය කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සඳහා ප්‍රමාද බදු ගෙවීම් අනුමත කෙරේ.

බදුමය ලාභය අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සහ ඉදිරියට ගෙන ආ භාවිතා නොකළ බදු ලැබීම් හා බදු පාඩු ප්‍රයෝජනයට ගත හැකි තාක් සෑම අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සහ ඉදිරියට ගෙන ආ භාවිතා නොකළ බදු ලැබීම් හා බදු පාඩුවක් සඳහා ම ප්‍රමාද බදු වත්කම් අනුමත කෙරේ.

3.3.6 මුදල් හා මුදල් තුල්‍යයන්

මුදල් හා මුදල් තුල්‍යයන් යනුවෙන් හැඳින්වෙන්නේ අත ඇති සහ බැංකුවෙහි තැන්පත් කර ඇති මුදල් ද අත්පත් කර ගැනීමේ දින සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක මුල් කල් පිරීම් සමග වෙනත් කෙටි කාලීන ඉහළ ද්‍රවශීලීතාවකින් යුත් ආයෝජනයි. ශේෂ පත්‍රයෙහි වත්මන් ණය තුරුස් යටතේ බැංකු අයිරා පෙන්නුම් කෙරේ.

4 මූල්‍ය මෙවලම් - මුල් හඳුනාගැනීම් සහ පසු ගණනය කිරීම්.

4.1 මූල්‍ය වත්කම්

4.1.1 මුල් අනුමතකරණය සහ පසු ගණනය කිරීම්

LKAS 39 විෂය පථය තුළ මූල්‍ය වත්කම් සුදුසු පරිදි ලාභ හෝ පාඩු, ණය හෝ අයවීම් ,ආයෝජන කල් පිරීම සඳහා රඳවා සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස සාධාරණ අගයකට වර්ගීකරණය කර ඇති අතර මුල් අනුමතකරණයේ දී එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය නිශ්චය කෙරේ.
ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමකට ආයෝජන සිදු නොවූ අවස්ථාවක වත්කම්වල ගණුදෙනු පිරිවැය එකතු කළ සාධාරණ වටිනාකමක දී සියලුම මූල්‍ය වත්කම් මූලික වශයෙන් අනුමතකරණය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් වල අංක 23 යටතේ මූල්‍ය වත්කම් අනාවරණ කෙරේ.

4.1.2 පසු ගණනය කිරීම්
මූල්‍ය වත්කම්වල පසු ගණනය කිරීම් පහත පරිදි ඒවායෙහි වර්ගීකරණය මත පදනම් වේ.

4.1.2.1ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයේදි මූල්‍ය වත්කම්
හෝ පාඩු මගින් සාධාරණ අගයේදි මූල්‍ය වත්කම්වලට වෙළඳාම සඳහා රඳවා ඇති මූල්‍ය වත්කම් සහ ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයේදි මූල්‍ය වත්කම් මූලික අනුමතකරණය මත වූ මූල්‍ය වත්කම් ඇතුළත් වෙයි.වෙළඳාම සඳහා රඳවා තබා ගැනීමේ මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා ආසන්නතම වාරයේ දී විකිණීමේ හෝ නැවත මිලදී ගැනීමේ කාර්යය සඳහා අත්පත් කර තබා ගත් විටයි.

ආදායම් ප්‍රකාශනයේ අනුමත සාධාරණ අගයෙහි වෙනස්කම් සමග සාධාරණ අගයේ දී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයේදි මූල්‍ය වත්කම් ඉදිරියට ගෙන එනු ලැබේ.

4.1.2.2 ණය සහ අයවීම්.

ණය සහ අයවීම් යනු ස්ථාවර හෝ නිශ්චිත ගෙවීම් සමග ව්‍යුත්පන්න නොවූ ක්‍රියාකාරී වෙළඳ පොළෙහි මිලගණන් ඉදිරිපත්නොවන මූල්‍ය30 වත්කම්ය. මූලික ගණනය කිරීමෙන් අනතුරුව එවැනි මූල්‍ය වත්කම් අපහායනය අඩුකළ සඵල පොළී අනුපාත ක්‍රමය(EIR)භාවිතයෙන් දෙවනුව ක්‍රමක්ෂය පිරිවැයට අදාළව ගණනය කරනු ලැබේ. වෙළඳපොලෙහි ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීම මත කවර හෝ වට්ටමක් හෝ අධිමිලක් සහ EIR හි සම්පූර්ණ කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙනි. E IR ක්‍රමක්ෂයට ආදායම් වාර්තාවේ මූල්‍ය ආදායම ඇතුළත් වෙයි. අපහායනය නිසා හටගන්නා පාඩු ආදායම් ප්‍රකාශයෙහි හඳුන්වා දෙනු ලැබේ.

4.1.2.3 කල් පිරීම සඳහා රඳවා තබන ආයෝජන

ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල් පිරීම් සමග ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල් පිරීම සඳහා රඳවා තබා ගැනීම යනුවෙන් වර්ගීකරණය කෙරේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව කල් පිරීම සඳහා රඳවා තබා ගනු ලබන ආයෝජන අපහායනය අඩු කළ සඵල පොළී ක්‍රමය ක්‍රමය භාවිතා කොට ක්‍රමක්ෂය පිරිවැය යටතේ ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීම මත කවර හෝ වට්ටමක් හෝ අධිමිලක් සහ EIR හි සම්පූර්ණ කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙනි. EIR ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමෙහි ඇතුළත් වෙයි. අපහායනය නිසා හටගන්නා පාඩු ආදායම් වාර්තාවේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනා ගනු ලැබේ.

4.1.2.4 විකිණීම සඳහා යෙදවිය හැකි මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා යෙදවිය හැකි මූල්‍ය ආයෝජනවලට සාධාරණත්ව කොටස් හා ණය සුරැකුම්පත් ඇතුළත් වෙයි. සාධාරණත්ව කොටස් ආයෝජන යැයි වර්ගීකරණය කරනු ලබන්නේ වෙළඳාම සඳහා රඳවා තබා නොගන්නා හෝ ලාභ හෝ පාඩු මගින් සාමාන්‍ය වටිනාකමේ දී නම් කරනු නොලබන ලෙස වර්ගීකරණය කරන්නා වූ විකිණීම සඳහා යෙදවිය හැකි ආයෝජනයි. මෙම කාණ්ඩය යටතේ ණය සුරැකුම්පත් යනු කාල නියමයක් නොමැතිව රඳවා තැබීමට අදහස් කෙරෙන සහ ද්‍රවශීලිතාව සඳහා අවශ්‍යතාවක් වශයෙන් විකිණිය හැකි හෝ වෙළඳපොල තත්ත්වවල වෙනස්වීම් සඳහා අවශ්‍යතාවක් වශයෙන් පවතින ආයෝජනයන් ය.

මූලික ගණනය කිරීමෙන් අනතුරුව විකිණීම සඳහා යෙදවිය හැකි ආයෝජන, සමුච්චිත ලැබීම් හෝ පාඩු වෙනත් ක්‍රියාකාරී ආදායමක හඳුනාගැනීමෙන් හෝ අපහායනය කිරීමට තීරණය කිරීමෙන් මූල්‍ය පිරිවැයේ ආදායම් ප්‍රකාශයේ සමුච්චිත පාඩුව නැවත වර්ගීකරණය කර ඇති අවස්ථාවේ දී සහ විකිණීම සඳහා යෙදවිය හැකි සංචිතවලින් ඉවත් කිරීමෙන් ආයෝජන අනුමත නොකෙරෙන තාක් විකිණීම සඳහා යෙදවිය හැකි සංචිතවල වෙනත් සමුච්චිත ආදායම් වශයෙන් හඳුනාගනු ලැබූ උපලබ්ධි නොවූ ලැබීම් හා පාඩු සමග සාධාරණ වටිනාකම යටතේ ගණනය කරනු ලැබේ.විකිණීම සඳහා යෙදවිය හැකි ණය සුරැකුම්පත් මත පොළී ආදායම ගණනය කරනු ලබන්නේ සඵල පොලී ක්‍රමය භාවිතයෙන් වන අතර ලාභ හෝ පාඩු වශයෙන් අනුමත කෙරේ.

4.1.3 අනුමත නොකිරීම

වත්කමින් මුදල් ගලන ලබා ගැනීමේ අයිතිය ඉකුත් වූ පසු මූල්‍ය වත්කමක්(මූල්‍ය වත්කමින් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක් අදාළ වන විට හෝ) අනුමතකරණය නොකෙරේ.

ii) සමූහය විසින් වත්කමින් මුදල් ගලන ලැබීමේ තම අයිතිය මාරු කරනු ලැබ තිබෙන්නේ නම් හෝ තුන්වන පාර්ශ්වයකට ද්‍රව්‍යමය ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් මුදල් ගලන ලැබීම් ගෙවීමට බැඳීමක් ඇතැයි උපකල්පනය කර ඇත්නම් සහ
- සමූහය විසින් වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ දෙවනුව මාරු කරනු ලැබ ඇත්නම් හෝ
- සමූහය විසින් වත්කම්වල සියලුම අවදානම් හෝ ප්‍රතිලාභ දෙවනුව මාරු කර හෝ රඳවා තබා ගෙන හෝ නොමැති නමුත් වත්කම්වල පාලනය මාරු කර තිබේ නම්
එවිට,
මූල්‍ය වත්කමක් (හෝ මූල්‍ය වත්කමින් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සහිත සමූහයක් අදාළ වන) අනුමත නොකෙරේ..

4.1.4 මූල්‍ය වත්කම්වල අපහායනය

සමූහය විසින් සෑම වාර්තාකරනු ලබන දිනයක දී මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් ගොනුවක් අපහායනය වී ඇති බවට අනුමත කළ හැකි කවර හෝ සාක්ෂ්‍යයක් පවතී ද යන්න තක්සේරු කරනු ලැබේ. මූලික අනුමතකරණයෙන් අනතුරුව හටගත්තා වූ සිදුවීම් එකක් හෝ වැඩි සංඛ්‍යාවක ප්‍රතිඵලයක් වශයෙන් සහ පාඩු ලැබූ සිදුවීම මූල්‍ය වත්කම්හි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ගලනය මත බලපෑමක් ඇති කර තිබේ නම් හෝ මූල්‍ය වත්කම් සමූහයක් තථ්‍ය ආකාරයෙන් තක්සේරු කළ හැකි නම් හෝ එසේ වන්නේ නම් පමණක් අපහායනය වීම සඳහා හඳුනාගත හැකි සාක්ෂ්‍යයක් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනය වී ඇති බව පෙනී යයි.

ණය කරුවන් හෝ ණයකරුවන් සමූහයක් විසින් වැදගත් මූල්‍ය දුෂ්කරතා, ණය ගෙවීම පැහැර හැරීම හෝ පොළියෙහි ණය මුදලෙහි ගෙවීම් පැහැර හැරීම, ඔවුන් බංකොලොත්භාවයට පත් වනු ඇති බවට සම්භාවිතාවක් පැවතීම හෝ වෙනත් මූල්‍යමය වශයෙන් නැවත සංවිධානය වීමක් ඇති බවට හැඟීයාම අන්තර්ගත වන අතර නිරීක්ෂණය කළ හැකි දත්ත මගින් හිඟ මුදලෙහි වෙනසක් හෝ පැහැර හැරීම හා සහ සම්බන්ධතාවක් දක්වන ආර්ථික තත්ත්ව වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලනයෙහි මිනිය හැකි පහත වැටීමක් පෙන්නුම් කරන විට අපහායනය සඳහා සාක්ෂ්‍යවලට අන්තර්ගත කළ හැකිය .

5. ණය තුරුස් සහ සැපයීම්

5.1 මූල්‍යමය ණය තුරුස්

5.1.1 මූලික අනුමතකරණය සහ ගණනය

LKAS 39 විෂය පථය තුළ මූල්‍යමය ණය තුරුස් වර්ගීකරණය කර ඇත්තේ ලාභ හෝ පාඩු, ණය සහ තාවකාලික ගැනීම්, වෙනත් මූල්‍ය වගකීම් මගින් සාධාරණ වටිනාකමේ දී මූල්‍යමය ණය තුරුස් හෝ මතු ඇතිවිය හැකි බාධාවන් වැළැක්විය හැකි මෙවලමක් සේ හැඳින්වෙන ව්‍යුත්පන්නක් වශයෙනි. සමූහය විසින් එහි මූල්‍යමය වගකීම් වර්ගීකරණය මූලික අනුමතකරණයේ දී ගැනීමේ දී නිශ්චය කරනු ලබයි.

සියලුම මූල්‍ය වගකීම් සාධාරණ වටිනාකමේ දී මූලිකවම අනුමතකරණය කරන අතර ණය සහ තාවකාලික ගැනීම් හා වෙනත් මූල්‍යම ණය තුරුස් ක්‍රමක්ෂය පිරිවැයට අදාළව සිදු කෙරේ.මෙයට ආරෝපණිය ගනුදෙනු පිරිවැය ඇතුළත් වෙයි.

සමූහයේ මූල්‍යමය ණය තුරුස්, වෙළඳ හා වෙනත් ගෙවීම් , බැංකු අයිරා, ණය හා තාවකාලික ගැනීම් සහ අනෙකුත් මූල්‍යමය වගකීම් අන්තර්ගත වෙයි.

5.1.2 *පසු ගණනය කිරීම්*

මූල්‍යමය ණය තුරුස් ගණනය කිරීම් එහි වර්ගීකරණය මත පහත පරිදි පදනම් වෙයි.

5.1.2.1*වෙනත් මූල්‍යමය ණය තුරුස්*

මූලික අනුමතකරණයෙන් අනතුරුව පොළී සහිත ණය සහ තාවකාලික ගැනීම් පසුව ගණනය කරනු ලබන අතර සඵල පොළී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට අදාළව එය සිදු කෙරේ.ණය තුරුස් අනුමත නොකළ විට මෙන් ම සඵල පොළී අනුපාත ක්‍රමයට ක්‍රමක්ෂය වීමේ ක්‍රියාදාමය ඔස්සේ ලැබීම් හා පාඩු ආදායම් ප්‍රකාශනයෙහි අනුමත කෙරේ.

ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ EIR හි අභ්‍යන්තර කොටසක් වශයෙන් අත්පත් කර ගෙන ඇති ගාස්තු හෝ පිරිවැය මත කවර හෝ අඩු කිරීමක් හෝ අධිමිලක් සැලකිල්ලට ගැනීමෙනි. EIR ක්‍රමක්ෂය ආදායම් වාර්තාවේ මූල්‍ය පිරිවැය ඇතුළත් වෙයි.

5.2 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

5.2.1 ***හඳුන්වා දී ඇති ප්‍රතිලාභ සැලැස්ම-විශ්‍රාමික පාරිතෝෂිකය***

සමූහය විසින් ප්‍රක්ෂේපණ ඒකක ණය ක්‍රමය (Projected Unit Credit Method) භාවිතයෙන් හඳුන්වා දුන් ප්‍රතිලාභ සැලැස්මක් වන පාරිතෝෂිකවල ප්‍රතිඥා දී ඇති විශ්‍රාමික ප්‍රතිලාභවල වත්මන් වටිනාකම ගණනය කෙරේ. හැකිතාක් දුරට සිදු වේ යැයි උපකල්පනය කරනු ලබන ගැලපීම් හා වෙනස්කම් සිදුකිරීමේ දී හටගන්නා ලැබීම් හා පාඩු අනෙකුත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ කොටස්වලට අය කිරීම හෝ බැර කිරීම සිදු කෙරේ.

එතෙකුදු වුවත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව මෙම බැඳීම් ආරම්භ වන්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුවයි.

5.2.2 ***හඳුන්වා දී ඇති දායක සැලසුම් - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාර අරමුදල***

සේවක අර්ථ සාධක අරමුලට සහ සේවක භාර අරමුදලට සමූහය දායක වන අතර දායක මුදල් මගින් අදාළ නීති රීති සමඟ අනුකූල වන අදාළ දායක අරමුදල් ආවරණය වෙයි.සේවකයන් ආවරණය කරනු ලබන සැලසුම්වලට දායක වීම සඳහා වන බැඳීම් ආදායම් වාර්තාවේ වියදම් වශයෙන් හඳුනා ගැනේ.

සේවක අර්ථ සාධක අරමුදල

සමූහය සහ සේවකයන් විසින්දළ වැටුපෙන් පිළිවෙලින් 12% හා 8% වශයෙන් අර්ථ සාධක අරමුදලට දායක කෙරේ.

සේවක භාර අරමුදල

සමූහය විසින් සේවක භාර අරමුදල සඳහා දළ වැටුපෙන් 3%ක් දායක කරනු ලැබේ.

6. ආදායම් සහ වියදම්

6.1 ආදායම් අනුමතකරණය

ආදායම් අනුමත කරනු ලබන්නේ ඒකරාශි වූ ආර්ථිකමය ප්‍රතිලාභ සමූහය වෙත ගලා යාමේ සම්භාවිතාවක් ඇති විට සහ ගෙවීම් සිදු කළත් ඒ බව නොසලකා ආදායම සහ දැරූ හෝ දැරීමට නියමිත සමුච්චිත පිරිවැය තත්‍යාකාරයෙන් ගණනයඑ කළ හැකි වීම වීමේ පදනමක් මත වෙයි. ගෙවීමට අදාළව හඳුන්වා දි ඇති ගිවිසුම්ගත නියමයන් සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ ලැබිය හැකි ප්‍රතිෂ්ඨාවේ සාමාන්‍ය අගයට ආදායම ගණනය කරනු ලැබේ.

පොළී ආදායම

ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබන සෑම මූල්‍ය මෙවලමක් සඳහා ම සහ විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති පොළි සහිත මූල්‍ය වත්කම් සඳහා,පොළි ආදායම හෝ වියදම වාර්තා කරනු ලබන්නේ මූල්‍ය වත්කම් හෝ ණය තුරුස්වල ඉදිරියට ගෙන ආ ශුද්ධ අගයට මූල්‍ය මෙවලමේ අපේක්ෂිත ආයු කාලය හෝ ඊට අඩු කාලයක් යන්නෙන් සුදුසු පරිදි ඇස්තමේන්තු කරන ලද ගෙවීම් හෝ ලැබීම් නිශ්චිතවම අවම්ල කරනු ලබන සඵල පොළී අනුපාතය (EIR), භාවිතයෙනි.ළී ආදායම ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායෙමෙහි ඇතුළත් වෙයි.

සේවා සැපයීම

ගිණුම් කාලය සැපයූ හා ඉටු කළ සේවා, සේවා සැපයීමෙන් ලැබූ ආදායම ලෙස හඳුන්වනු ලැබේ.

වෙනත් ආදායම්

ඒකරාශි කිරීමේ පදනමක් මත වෙනත් ආදායම් හඳුනාගනු ලැබේ.

6.2 වියදම්

ව්‍යාපාර පවත්වාගෙන යාමේ දී දැරීමට සිදුවන සියලු වියදම් වසර සඳහා ලාභය මත ළඟා වන ආදායමට ගෙවනු ලැබ තිබේ. අලුත්වැඩියා සහ අලුත් කිරීම් වියදම් දැරීමට සිදු වූ වර්ෂයේ ලාභ සහ පාඩු වලට ගණනය කෙරේ.

7. SLAS(SLFRS/LKAS) ප්‍රථම වරට යොදා ගැනීම /ප්‍රතිග්‍රහණය

මෙම මූල්‍ය ප්‍රකාශන, 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා **SLFRS/LKAS අඩංගු කර** SLASසමග අනුකූල වන පරිදි භාර අරමුදල මගින් පිළියෙල කරන ලද සමූහ මූල්‍ය34ප්‍රකාශනවල පළමු කාණ්ඩය වන්නේ ය.2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය දක්වා එම වර්ෂයද ඇතුළත් කාල සීමාව සඳහා භාර අරමුදල මගින් පූර්ව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව තනි මූල්‍ය ප්‍රකාශන පමණක් සකස් කරන ලදී.

ඒ අනුව, **SLFRS/LKAS අඩංගු කර** SLASසමග අනුකූල වන පරිදි භාර අරමුදල මගින් පිළියෙල කරනු ලැබ ඇති සමූහ මූල්‍ය34ප්‍රකාශන අදාළ වන්නේ ගිණුම් ප්‍රතිපත්ති වල විස්තර කෙරෙන පරිදි 2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය අවසන් වන විට සංසන්දනාත්මක කාල දත්ත ද සමග 2012ජනවාරි 01 වන දිනෙන් හෝ ඊට පසුව ආරම්භ වන කාලසීමාවටය.

